# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,554 — 1965 නොවැම්බර් 12 වැනි සිකුරාද — 1965.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් හාඟවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය .. | — | ආණ්ඩුවේ නිවේදන .. .. .. | 1590 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය .. .. | 1587 | මිළ පාලන දැන්වීම .. .. .. | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය .. | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම .. .. .. | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය .. | 1538 | ආදායම හා වියදම පිළිබඳ වාර්තා .. .. | — |
| වෙනත් පත් කිරීම් ආදිය .. .. .. | 1589 | ආණ්ඩුවේ වත්කම හා බැරකම ප්‍රකාශ .. .. | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය .. .. | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම .. .. .. | 1592 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම .. .. | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1965 අංක 414

අ. ආ. කා. අංක එන්. 108/65.

අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, (393 වැනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19 වැනි වගන්තිය යටතේ, ලංකා පරිපාලන සේවයේ, පට්ටියගේ ආනන්ද තිස්ස ගුණසිංහ මහතා, 1965 ඔක්තෝබර් 6 වැනි දින සිට, එකී පනත යටතේ 1965 ඔක්තෝබර් 5 වැනි දින පත් කරන ලද, මහජන බැංකු කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 නොවැම්බර් 4 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11-404

---

### 1965 අංක 415

අ. ආ. කා. අංක එන්. 109/65.

අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, (393 වැනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19 (1) වැනි වගන්තිය යටතේ, ආණ්ඩුවේ අධිනීතිඥ, එස්. සිවරාසා මහතා 1965 ඔක්තෝබර් 25 වැනි දින සිට, එකී පනත යටතේ, 1965 ඔක්තෝබර් 22 වැනි දින පත් කරන ලද, රජයේ දෙපාර්තමේන්තු උදෙසා ගොඩනැගිලි තැනීම හෝ අනෙකුත් වැඩ සම්බන්ධයෙන් පෞද්ගලික අයවලුන් හෝ කණ්ඩායම් විසින් ටැන්ඩර් ඉදිරිපත් කර හෝ නොකර ලබාගත් කොන්ත්‍රාත්තු ගැන පරීක්ෂා කිරීමේ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 නොවැම්බර් 5 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දිය.

11-423

### 1965 අංක 416

අංකය: ඩී.250/රෙක් ට/3.

**යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම් සඳහන් නිලධාරි තැන, 1965 ජූලි මස 1 වැනි දින සිට, තාවකාලික මේජර් වශයෙන්:—

කපිතාන් යසාවන්තුකු රාජපක්ෂ ඉදියන්සෙලාගේ පර්සි විජේකෝන්, ල. කා. ග.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

එම්. ජී. පී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් 2 වැනි දින,
කොළඹ දිය.

11-443

---

### 1965 අංක 417

අංකය: ඩී/විඑජ්/42 (III).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් වීමක්**

1965 ඔක්තෝබර් 1 වන දින සිට බ්‍රිගේඩියර් කර්නල් වශයෙන්—

ලුතිනන් කර්නල් බර්ට්‍රම් ලූපන් සෙනෙවිරත්න, ඇම්බීඊ., ඊඩී.,

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

එම්. ජී. පී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් 2 දින,
කොළඹ දිය.

11-442

1965 අංක 418

අංකය : ඩී/විඑජ්/30.

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පදවි අත් හැරීමක් හා ඇතුලත් කිරීමක්

(අ) පදවි අත් හැරීම

1965 ඔක්තෝබර් 1 වන දින සිට ලුතිනන් කර්නල් හෙන්රි ස්ටැන්ලි රුද්‍රිගු ගුණවර්ධන, ලං. ශී. හ., ලංකා ශිල්ප හට බලකායේ අණදීම අත් හරියි.

(ආ) ඇතුලත් කිරීම

1965 ඔක්තෝබර් 1 වන දින සිට ලුතිනන් කර්නල් හෙන්රි ස්ටැන්ලි රුද්‍රිගු ගුණවර්ධන, ලං. ශී. හ., ලංකා ශිල්ප හට බලකායේ උප සේවයට ඇතුලත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් 2 දින,
කොළඹ දීය.

11-453/1

1965 අංක 419

අංකය : ඩී/විඑජ්/30.

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පදවි අත් හැරීමක් හා ඇතුලත් කිරීමක්

(අ) පදවි අත් හැරීම

1965 ඔක්තෝබර් මස 1 වන දින සිට බ්‍රිවේ කර්නල් මොරවක් කෝරලගේ සිසිල් ෆොන්සේකා අභයකෝන්, ඊඩී., ලංකා යුද හමුදා පුරෝගාමී බලකායේ අණදීම අත් හරියි.

(ආ) ඇතුලත් කිරීම

1965 ඔක්තෝබර් මස 1 වන දින සිට බ්‍රිවේ කර්නල් මොරවක් කෝරලගේ සිසිල් ෆොන්සේකා අභයකෝන්, ඊඩී., ලංකා යුද හමුදා පුරෝගාමී බලකායේ උප සේවයට ඇතුලත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි.

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් 2 දින,
කොළඹ දීය.

11-453/2

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 420

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑල්. 42. ඩී/61.

ඩී. එස්. නෙත්සිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බී. පෙරේරා මහතා 1965 ඔක්තෝබර් 26 වැනි දිනද සහ 1965 දෙසැම්බර් 9 වැනි දින සිට 13 වැනි දින දක්වා කුරුණෑගල මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 6. සී/52.

වී. එම්. කුමාරස්වාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1965 නොවැම්බර් 5 වැනි දින සිට 9 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්./ඒ. 11/65.

ජේ. ජී. ආසීර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. මතවරාජා මහතා 1965 ඔක්තෝබර් 29 වැනි දින සිට, 1965 නොවැම්බර් 1 වැනි දින දක්වා, ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 8. බී./57.

බී. ටී. ද සිල්වා සහ එම්. ජමීල් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. ඊ. බස්නායක මහතා 1965 දෙසැම්බර් මස 10 සහ 11 වැනි දිනයන්හි ගම්පහ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 42. ඩී/61.

ඩී. එස්. නෙත්සිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ඩබ්ලිව්. පෙරේරා මහතා 1965 දෙසැම්බර් 10 වැනි දින, කුරුණෑගල මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 63. ඒ/58.

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ටී. එස්. වික්‍රමරත්න මහතා 1965 ඔක්තෝබර් 27 වැනි හා 28 වැනි දිනයන්හි, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 68. බී/53.

ඒ. වෛත්‍යලිංගම් සහ එස්. බී. ගුණවර්ධන යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සෙන්ට්. ටී. අමරසිංහ මහතා 1965 දෙසැම්බර් 9 වැනි දින සිට 12 වැනි දින දක්වා, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 31. බී/62.

එස්. ජෝකනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එස්. ඒ. පෙරේරා මහතා 1965 ඔක්තෝබර් 29 වැනි දින සිට 31 වැනි දින දක්වා සහ 1965 දෙසැම්බර් 9 වැනි දින සිට 12 වැනි දින දක්වා, කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභා සීමා තුල පිහිටි කනදුල්ලේ ක්‍රියා කරන පිණිස කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 65. ඒ/61.

ජේ. බී. සී. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. වීරකෝන් මහතා 1965 ඔක්තෝබර් 28 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ කොළඹ, නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ජී. පණ්ඩිතසේකර මහතා 1965 නොවැම්බර් 3 වැනි දින, හලාවත දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ පුත්තලමේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 70. ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. තිලියනාදන් මහතා 1965 ඔක්තෝබර් 27 වැනි දින සහ 1965 නොවැම්බර් 4 වැනි දිනද, කොළඹ රික්වැස්ට් කොමසාරිස් සහ අතිරේක මහෙස්ත්‍රාත් වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 13. ඒ/59.

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ජේ. ෆොන්සේකා මහතා 1965 ඔක්තෝබර් 30 වැනි දින සහ 1965 නොවැම්බර් 6 වැනි දින සිට 8 වැනි දින දක්වා, පානදුර මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 27. ඒ/51.

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා 1965 නොවැම්බර් 1 වැනි දින, මීගමුවේ දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 34. ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසිර්වාදම් මහතා 1965 නොවැම්බර් 5 වැනි දින, රත්නපුර දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ.එල් 16.ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා 1965 නොවැම්බර් 3 වැනි දින, මීගමුවේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 10. ඒ/53.

ඊ. එෆ්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බර්තෝලමියුස් මහතා 1965 නොවැම්බර් 5 වැනි දින සිට 9 වැනි දින දක්වා, නුවරඑළියේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 55. බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. පී. විජයතිලක මහතා 1965 නොවැම්බර් 5 වැනි දින සිට 9 වැනි දින දක්වා, මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදුරේ මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර, නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1965 ඔක්තෝබර් 31 වැනි දින සිට, අනුරාධපුර දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 12. ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එඩ්වර්ඩ්ස් මහතා 1965 නොවැම්බර් 4 වැනි දින සිට 9 වැනි දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 75. ඒ/63.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1965 නොවැම්බර් 5 වැනි දින සිට 9 වැනි දින දක්වා, කෑගල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/

කේ. ජී. ජයසේන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ශ්‍රී පත්මනාදන් මහතා 1965 නොවැම්බර් 4 වැනි හා 5 වැනි දිනයන්හි, බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති වශයෙන් හා යටිකිඳ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 11/63.

ජී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. එල්. අබේරත්න මහතා 1965 නොවැම්බර් 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ, කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ නවදුන් කෝරලේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 11/63.

ජී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වනසුන්දර මහතා 1965 නොවැම්බර් 4 වැනි දින සිට 6 වැනි දින දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ, කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ නවදුන් කෝරලේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑ්ඒ. 37/57.

ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1965 නොවැම්බර් 22 වැනි දින සිට, වාරියපොල ගම්බද උසාවියේ අංක 2,575 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් සහ වන්නිහත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන්.

සී. ඊ. ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 නොවැම්බර් මස 4 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

11-406

---

# වෙනත් පත්කිරීම් ආදිය

1965 අංක 421

**පත් කිරීම**

අතිගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව, එතුමා විසින්—

අංක : පා. 4/සාවි. 14/15.

1. විදානගම වත්තේ දොන් නිකුලස් චන්ද්‍රසේකර මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 37/16.

2. අමරසිංහ ආරච්චිගේ මුදලිහාමි ගුණරත්න මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත්කර ඇත්තේය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965. 11. 6 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදී ය.

11-457

---

1965 අංක 422

## දැන්වීමයි

අර්ල් වින්ස්ටන් මිල් රෝසි ජයවර්ධන මහතා කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

11-382

---

1965 අංක 423

## දැන්වීමයි

එලයතම්බි කාසිනාදර් මහතා අලවෙට්ටි හි වාසස්ථානය සහ කාර්යාලය ද ඇතුව යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965ක්වූ ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය,

11-322

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 23/63

### 1963 අංක 11 දරන මුදල් පනත

121 (1) වන වගන්තිය යටතේ ආඥාව

1963 අංක 11 දරණ මුදල් පනතේ 121 (1) වන වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර මුදල් ඇමති උක්තු බණ්ඩා වන්නිනායක වන මම, මේ ආඥාවෙන්, 1964 ජනවාරි පළමු වන දින බල පැවැත්වෙන යම් ගිවිසුමක් හෝ ගිවිසුම් යටතේ ලංකා ආණ්ඩුවට යම් තානාපතිතකු විසින් සපයනු ලබන අරක්කු, ඉහත කී පනතේ XII වන කොටසෙහි කාර්යයන් සඳහා අත් හරිනු ලැබූ භාණ්ඩයක් වශයෙන් ප්‍රකාශ කරමි.

උ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1965 නොවැම්බර් මස 1 වන දින,
කොළඹ දීය.

11-360

---

අංකය : ඒබීඩී/සී. 17/9.

### බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත

(318 වැනි අධිකාරය වන) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 6 (1) දදණ වගන්තියේ විධිවිධාන අනුව යථෝක්ත ආඥාපනතේ 5 වැනි වගන්තියෙහි සඳහන් වන උපදේශක මණ්ඩලයේ සාමාජික යෙකු ලෙස ඩී. බී. විජේතුංග මහතා මෙහි පහත සඳහන් දින සිට අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා ගරු අධිකරණ ඇමතිතුමා විසින් පත් කොට ඇති බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙසින් 1965 ඔක්තෝබර් මස 28 වෙනි දින,

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් මස 3 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදිය.

11-459

---

අංකය : පිආර්/ඒඑජ්/7.

### නිවේදනයයි

නෝර්වේය වෙනුවෙන් කොළඹ සිටින නිර්වේතනික කොන්සල් කාල් ගවුස් මහතා 1965 ඔක්තෝබර් මස 1 වැනිදා සිට කොන්සල් වශයෙන් කටයුතු නොකරන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙසින් නිවේදනය කර සිටී.

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 28 වෙනි දින,
කොළඹ 1, සෙනේට් මන්දිරයෙහි,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේදී ය.

11-303/1

---

අංකය : පිආර්/ඒඑජ්/7.

### නිවේදනයයි

මයිකල් ඇනෝ මහතා කොළඹ සිටින නෝර්වේ නිර්වේතනික කොන්සල් වශයෙන් 1965 ඔක්තෙබර් මස 1 වෙනිදා සිට තාවකාලිකව පිළිගැනීමට විදේශ කටයුතු භාර ගරු ඇමති තුමා සතුටුවී ඇත.

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 28 දින,
කොළඹ 1, සෙනේට් මන්දිරයෙහි,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේදී ය.

11-303/2

---

ඇල්. ඩී.—බී. 18/46.

### සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥාපනත

ආඥාව

(127 වැනි අධිකාරය) වන සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාණිජ හා වෙළෙඳ ඇමති කැත්පත් මාපිටියගේ වෙලින් පීටර් පීරිස් වන මම, 1965 මැයි 7 වැනි දින හා අංක 14,390 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ ආඥාව, එව යකල උපලේඛනයෙහි 1 වන තීරයේ අගට පහත දක්වෙන—

" කුරුකුලසූරිය එම්මානුවෙල් ජූලියන් එඩ්ගර් ප්‍රනාන්දු

ගෙත්රි විල්ප්‍රෙඩ් පරරාජසිංහ සත්‍යසිංහ"

යන්න ඇතුළත් කිරීමෙන්, මේ ආඥාවෙන් සංශෝධනය කරමි.

එම්. වී. පී. පීරිස්,
වාණිජ හා වෙළෙඳ ඇමති.

1965.11.1 වැනි දින,
කොළඹ දී ය.

11-331

---

ඇල්.ඩී.බී. 20/51.

### ගුවන් ගමනාගමන පනත

(365 වන අධිකාරය වන) ගුවන් ගමනාගමන පනතේ 24 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලැබූ නියෝගය.

ඊ. එල්. බී. හුරුල්ලේ
ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමති.

1965.11.5 දින,
කොළඹ දීය.

නියෝගය

1955 ජූලි මස 1 වැනි දින අංක 10,812 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත, 1955 ලංකා ගුවන් ගමනාගමන නියෝග, මේ නියෝගය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයෙහි පටන් මෙහි පහත සඳහන් පරිදි මෙසින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 158 වැනි නියෝගයෙහි "නොපැදවිය යුතුය" යන වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :—

> "නොපැදවිය යුතු ය. ගුවන් යානයකට සම්බන්ධ මෙහෙයුම් අත්පොතින් එබඳු ගුවන් යානයක් සම-නියමුවකු රැගෙන යා යුතු බව නියම නොකෙරෙන සෑම අවස්ථාවකදීම, සම-නියමුවකු සම්බන්ධයෙන්ද මේ නියමය අදාළ විය යුතු ය"; තවද

(2) එහි 294 වැනි නියෝගය අවලංගු කිරීමෙන්.

11-320

---

අංකය : වි23/පී. 36/65.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කිලිනොච්චි, වඩක්කච්චි, ගඩිසන් පාරේ, අංක 755 හි, එස්. කොකනාදන් මහතා හා කිලිනොච්චි, (තරකා) රාමනාතපුරම්, කල්මඩු, සීමාසහිත කල්මඩු නගර් විවිධ සේවා සමුපකාර සමිතිය අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද :

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති කැත්පත් මොහොමඩ් හනීෆා මොහොමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, බේරුම්කරුවා වශයෙන් කොළඹ 5, ශ්‍රීන්ලන්ඩ්ස් මාවතේ, අංක 11 හි වී. ඒජ්. ගුණරත්න මහතා පත්කර එකී ආරාවුල බේරුම් කිරීමෙන් සම්ථයකට පත් කිරීම සඳහා මෙසින් ඔහු වෙත යොමු කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු, රැකීරක්ෂා සහ නිවාස ඇමති.

1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹදීය.

## කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

කිලිනොච්චි, වඩක්කච්චි, හව්සන් පාරේ, අංක 755 හි, එස්. සොකනාදන් මහතා,

සහ

කිලිනොච්චි, (හරහා) රාමනාතපුරම්, කල්මඩු, සීමාසහිත කල්මඩු නගර විවිධ සේවා සමුපකාර සමිතිය

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

කිලිනොච්චි, වඩක්කච්චි, හව්සන් පාරේ, අංක 755 හි, එස්. සොකනාදන් මහතා සහ කිලිනොච්චි, (හරහා) රාමනාතපුරම්, කල්මඩු, සීමාසහිත කල්මඩු නගර විවිධ සේවා සමුපකාර සමිතිය අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ : එස්. සොකනාදන් මහතා රැකියාවෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට හිමි විය යුතු සහනය කුමක් ද යන්නය.

1965 ඔක්තෝබර් මස 19 දා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
වැඩබලන කම්කරු කොමසාරිස්.

11-307

---

අංකය : ඊ23/ඊ233/64.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව මාතර, දියගහ, ගල්බොඩ, පී. එම්. ඉතෝනිස් මහතා හා කබුරුපිටියේ, සීමාසහිත මාතර ගඟබඩ පත්තුවේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද :

කම්කරු, රැකිරක්ෂා සහ නිවාස ඇමති තැන්පත් මොහොමඩ් හනීෆා මොහොමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක IV දරන කම්කරු විනිශ්චය සභාව වෙත මෙසින් යොමු කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු, රැකිරක්ෂා සහ නිවාස ඇමති.

1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹදීය.

---

## කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

මාතර, දියගහ, ගල්බොඩ, පී. එම්. ඉතෝනිස් මහතා,

සහ

කබුරුපිටියේ සීමාසහිත මාතර ගඟබොඩ පත්තුවේ, විවිධ සේවා සමුපකාර සමිති සංගමය

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

මාතර, දියගහ, ගල්බොඩ, පී. එම්. ඉතෝනිස් මහතා සහ කබුරු පිටියේ, සීමාසහිත මාතර ගඟබොඩ පත්තුවේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ : පී. එම්. ඉතෝනිස් මහතා සේවයෙන් පහ කිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට කවර සහනයක් හිමිවිය යුතුද යන්නය.

1965 ඔක්තෝබර් මස 19 දා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
වැඩබලන කම්කරු කොමසාරිස්.

11-308

---

අංකය : සී. අයි. ඊ/89/64.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩ බලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ගාල්ලේ දෙල්ලව, කලුවගගහේන වත්තේ පී. විදානගම මහතා හා මාතර, ඉසදීන් නගරයේ පදිංචි කලුවගගහේන වත්තේ අයිතිකාරිය වන ජී. අබේසුන්දර මහත්මිය අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද :

කම්කරු, රැකිරක්ෂා සහ නිවාස ඇමති තැන්පත් මොහොමඩ් හනීෆා මොහමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක IV දරන කම්කරු විනිශ්චය සභාව වෙත මෙසින් යොමු කරමි.

එම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකිරක්ෂා සහ නිවාස ඇමති.

1965 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ දීය.

---

## කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

ගාල්ලේ දෙල්ලව කලුවගගහේන වත්තේ, පී. විදානගම මහතා

සහ

මාතර, ඉසදීන් නගරයේ පදිංචි කලුවගගහේන වත්තේ අයිතිකාරිය වන ජී. අබේසුන්දර මහත්මිය

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

පී. විදානගම මහතා සහ ජී. අබේසුන්දර මහත්මිය අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ : කලුවගගහේන වත්තේ අයිතිකාරිය වන ජී. අබේසුන්දර මහත්මිය විසින් පී. විදානගම මහතා සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට කවර සහනයක් හිමිවිය යුතුද යන්න වේ.

1965 ඔක්තෝබර් මස 27 දා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
වැඩබලන කම්කරු කොමසාරිස්.

11-376

---

ආර්.ඩී.—බී. 51/50.

## කොළඹ වරාය (පරිපාලන) පනත

### 14 (3) වන වගන්තිය යටතේ නිවේදනය

1950 අංක 10 දරන කොළඹ වරාය (පරිපාලන) පනතේ 12 වන වගන්තිය යටතේ ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබ 1964 ඔක්තෝබර් 2 වන දින අංක 14,187 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය 1965 ජනවාරි 2 වන දින සිට අවලංගු කරනු ලැබූ සේ සැලකිය යුතු බව මෙසින් නිවේදනය කරනු ලැබේ.

ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 28
කොළඹ දීය.

11-315/1

ඇල්.ඩී.—බී. 51/50.

## කොළඹ වරාය (පරිපාලන) පනත

(238 වැනි අධිකාරය වන) කොළඹ වරාය (පරිපාලන) පනතේ 12 වන වගන්තිය යටතේ ජනසතු සේවා ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඩී. බී. වෙලගෙදර,
වැඩ බලන ජනසතු සේවා ඇමති.

1965 ඔක්තෝබර් 28 වැනි දින,
කොළඹදී ය.

නියෝගය

කොළඹ වරායේ නෞකා ශෝධක තටාකය හා නියමු පාලම පාවිච්චි කරන යාත්‍රාවලට ජලය සැපයීම සඳහා, ඒ සැපයීමේ එක් එක් ගැලුම් 1,000 කට හෝ ඉන් කොටසකට රුපියල් 10.50 බැගින් ගණන් බලන ලද අය කිරීමක් වරාය කොමසාරිස් විසින් අය කළ යුතු ය.

11-315/2

## තලවිල-මාරවිල ධීවර ආරවුල

යථෝක්ත ධීවර ආරවුල සම්බන්ධ ප්‍රසිද්ධ විභාගය පැවැත්වූ ජී. ඊ. අමරසිංහ මහතාගේ වාර්තාව 1965 දෙසැම්බර් 4 වැනි දින පූ. භා. 10.00 ට කොළඹ 3, ගාලු මුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ පුස්තකාල ශාලාවේ දී කියවනු ලබන බව ආරවුලට සහභාගි පක්ෂයන්ගේ හා එය පිළිබඳ උනන්දුවක් දක්වන අනිකුත් අයගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

සැම් එච්. සිල්වා,
ධීවර අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේදීය.

11-373

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත

1959 අංක 5 දරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත යටතේ පහත දක්වෙන උපලේඛනයේ අංක 1 සහ 2 යන ශීර්ෂයන්හි දක්වෙන ණයකරුවන් සහ ණය හිමියන් යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර ඇත.

මේ සඳහා ඒ ඒ ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය පිළිබඳ විස්තර ප්‍රකාශනයක් 1965 නොවැම්බර් මස 26 වෙනි දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ණය හිමියන්ට මෙයින් දන්වනු ලැබේ.

ඇම්. ඒ. අමරසිංහ,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලය.

1965 ක්වූ නොවැම්බර් මස 6 වෙනි දින,
කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 33/1,
'' අම්රා '' නැමැති නිවසේ පිහිටි
ණය සහනදායක මණ්ඩල කාර්යාලයේදීය.

### උපලේඛනය

| ඉල්ලුම්පත් අංක | ණයකරුගේ නම සහ ලිපිනය | ණය හිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 14301 | ... ඇස්. දේවරාසා සහ භාර්යාව නාසම්මා, නුනවිල් නැගෙනහිර, චාවාකච්චේරි | වී. සින්නතම්බි, මන්තුවිල්, කොඩිකාමම |
| 14307 | ... කේ. ඇග්නස් ප්‍රනාන්දු, දිගල්ල, වැලිපිල්ලෑව ... ... | සී. පී. ප්‍රනාන්දු, කබලෑව, දිගල්ල |
| 14310 | ... ටී. පී. නන්දදේව සහ ටී. පී. සෝමදේව, පරපේ, රඹුක්කන ... | ඩබලිව්. ඒ. ඇස්. ජයවීර, වේරවැල්ල, ඉදුල්ගොඩකන්ද |
| 14315 | ... ඇස්. එම්. ප්‍රනාන්දු, සාන්ත විසෙන්ති පාර (මඩම පාර), දියලගොඩ, මග්ගොන | එච්. ඇල්. ඇස්. ප්‍රනාන්දු, (විවාහයට පෙර පීරිස්), අංක 432, ගාලුපාර, රාවතාවත්ත, මොරටුව |
| 14320 | ... ඇම්. ඒ. ඒ. ආර්. ඇම්. ලෙබ්බෙ ගේ පුත්, අබ්දුල් කාදර් ලෙබ්බෙ, මරාතුගොඩ, පූජාපිටිය | ඇම්. ජී. ඇලිස් (මියගොස්); උරුමකරු: ජේන්නෝනා, ඉහගම, මඩවල |
| 14321 | ... ඇප්. ඒ. දියානායක සහ ආර්. සී. දිසානායක, අළුත්ගම, යක්කල | ෆේ. ජී. අර්නෝල්ඩ්, සැන්ට් ජුට් ටවුන්, ඉදිගොල්ල, ගම්පහ |
| 14326 | ... එච්. ඇම්. සියාතු, බස්තිරාවේගෙදර, ගැල්ලගමුව, බෝගහකුඹුර | ඇම්. ඇම්. පූංචිරාල, කහටගහවත්තෙ ගෙදර, බිබිල්ගමුව, බෝගහ කුඹුර |
| 14328 | ... ඩී. ඩී. දහනායක, දිද්දෙනිපොත, මාකදුර ... ... | ඒ. පී. පෙඩ්රිස් නොහොත් ඇඩ්වින්, දිද්දෙනිපොත, මාකදුර, 2. එච්. ආර්. දෙන් කරෝලිස්, තිබ්බොටුලන්ද, දිද්දෙනිපොත, මාකදුර |
| 14330 | ... එච්. ඩී. ටී. ප්‍රනාන්දු, උග්ගහහේන, වල්පොල, රාගම ... | ආර්. ඩී. සේදිරිස්, 1/18, උසාවි පාර, ගම්පහ |
| 14341 | ... එච්. ඇම්. හේරත් බණ්ඩා, එලිවිල, ගෝනවිල ... ... | ඩබලිව්. පී. ප්‍රනාන්දු, දූරළුව, ගෝනවිල 2. ඩබලිව්. ඇස්. ප්‍රනාන්දු, දූරළුව, ගෝනවිල |
| 14343 | ... ටී. බී. අමුනුගම සහ කේ. කුමාරිහාමි, 12, පුත්තලම් පාර, කුරුණෑගල | වයි. ඇම්. ඇස්. කුලතුංග, මීගමු පාර, බමුනාවල, කුරුණෑගල |
| 14344 | ... කේ. පොන්නයියා, පොන්නයියා පොන්නම්මා, පුත්තූර් බටහිර, පුත්තූර් | ඇම්. රාජරත්නම්, නාවකේරි, පුත්තූර් බටහිර, පුත්තූර් |
| 14353 | ... ආර්. ඇම්. ද සිල්වා, නිල්දණ්ඩාහින්න වත්ත, නිල්දණ්ඩාහින්න ... | ජී. එච්. ලීලාවතී, නමබිමුල්ල, අම්බලන්ගොඩ |
| 14354 | ... ඒ. ඇම්. ටිකිරිබණ්ඩා, ගලබඩගම, උහුමීය ... ... | ඇල්. ඇම්. අප්පුහාමි, ගලබඩගම, උහුමීය |
| 14359 | ... පී. එච්. ඇම්. බණ්ඩාර, 296, දළුගන්ගොඩ, කැළණිය ... | ටී. ඇම්. එන්ඩින්, 11, හරස් පාර, ගල්කිස්ස |
| 14365 | ... ඒ. සී. ප්‍රනාන්දු, වැලිගම්පිටිය, ජා-ඇල ... ... | පී. ඩී. ඇම්. ඇල්ප්‍රඩ් ඇප්. සෙනවිරත්න, අමන්දෙළුව, සීදූව |
| 14366 | ... කේ. ඒ. මීහිඳුකුලසූරිය, 6/618, නාවල පාර, රාජගිරිය ... | ඇන්. සී. පෙරේරා, මාලාබෙ, තලංගම |
| 14370 | ... ඩී. ශූ. ද සිල්වා කුලරත්න, '' සිරිභවන '', අම්බලන්ගොඩ ... | ඒ. ඇම්. ඇල්. බී. ගංගොඩතැන්න, කේන්දරගම, හිඟුල |
| 14379 | ... බී. ඇස්. ඇම්. ප්‍රනාන්දු, බී. ඇස්. කේ. ප්‍රනාන්දු, 803, වැලිගම පාර, අළුත්ගම | ඇල්. ඒ. සිල්වා, ලද්දුව, මීගම |
| 14383 | ... එච්. ඩී. ආර්. ඇල්. දර්මසේන, 129, තෙබුවන ... ... | කේ. ඩී. ආර්. රණවීර, දෙඩන්ගොඩ, දනට පදිංචි ස්ථානය කේරගල වත්ත, කුරුවිට |
| 14393 | ... ඇම්. කිරිනේරිස්, ගවරගිරිය, අයගම ... ... | ඒ. ඇල්. ඩී. පෙරේරා, දූම්බර, මනාන, ගවරගිරිය |
| 14394 | ... ඇස්. පී. විජයවර්ධන, අංක 9, දෙවටගහවත්ත, එඬේරමුල්ල, වත්තල | කේ. එච්. සිරිසේන, මේ ජලවර් බිස්කට් සමාගම, 544, මීගමු පාර වත්තල |
| 14396 | ... ජී. ඇල්. ඇල්. රත්නායක, ගොඩිගමුව, මොරොන්තොට ... | ඇම්. ඇම්. ඊබ්‍රාහිම්, පාතිමා ස්ටෝර්ස්, මොරොන්තොට |
| 14398 | ... ඇස්. ඕ. ඒ. ලීලාවතී, වානලුවාව, දෙම්පේ ... ... | පී. ඒ. දෝන කර්ලැයින් හාමිනේ, කපුගොඩ |
| 14400 | ... ඩී. ඒ. ඇම්. රත්රනා, කුරුකුත්තල, කඩුගන්නාව ... | පී. ජී. සෙල්ලප්පු, කුරුකුත්තල, කඩුගන්නාව |

| ඉල්ලුම් පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණය හිමියගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 17563 | ජී. ජී. මිසිනෝනා, බටකැටියකෙරදේවල, මා/කෙරදේවල | ඊ. ඇල්. ජේ. ගුණවර්ධන, 51, ස්ටැපඩ් පෙදෙස, මරදාන, කොළඹ 10 |
| 17627 | ආර්. සිරිසෝම, පිල්ලාවත්ත, රත්මීවල, මැණික්දිවෙල | ආර්. රන්කිරි, රත්මීවල, මැණික්දිවෙල |
| 17680 | ඇස්. එච්. ඇස්. සිරිවර්ධන (කලින් ජෙම්වන්ද්‍ර), අංක 358, බටලන්ද පාර, මහර නුගේගොඩ, කඩවත | ජී. ඇම්. ලිව්නිය අප්පුහාමි, මහරකැන්ද ලියැද්ද පාලුවේ හිටපු පොලිස් කොස්තාපල්, කඩවත |
| 17683 | ඒ. ඒ. ඇට්. සුබයාර්, 71/4, අක්‍රාගොඩ පාර, දීනාංගාඩ, බෙරුවල | ඇම්. කේ. රණසිංහ, '' ශ්‍රීතිලක '', පොතුපිටිය, වාද්දුව |
| 17698 | ඒ. ඇස්. යසවති, උයන්වත්ත දකුණ, පිටදූව පාර, මාතර | ඒ. ඇස් කරුනේලිස්, පිටදූව, මාතර |
| 17727 | වී. පී. පොඩිහාමිනේ, ඉත්තපානවත්ත, පහාරංගාඩ, පතලිප්පිල | ඩබ්ලිව්. පී. මාටින්, අඹනිවළ, පහාරංගාඩ, තෙලිප්පිල |
| 18350 | ඒ. ලෙබ්බෙගේ පුත් මුන්තාලිබු, උඩිස්පත්තුව, මහනුවර | ජී. ඩී. නන්ජාවති, උඩිස්පත්තුව |
| 18351 | ඇස්. ග්‍රිගෝරිස්ගේ වැන්දඹුව විසින්, සාන්ත අන්තෝනිගේ පටුමග, මතගල් | ඇස්. ඒ. සෙල්වරාජා සහ භාර්යාව, මෙරි පුතමලෙයි, වෙටකුද්දි, මාතගල් |
| 18520 | ඇස්. කේ. ටී. සෙනෙවිරත්න, '' රත්නගිරි '', ගංගොඩ පාර, කෑගල්ල | කේ. ඒ. පිංහාමි, ඇදුරාපොත, කෑගල්ල |
| 18601 | ඩී. එච්. ඇස්. නානායක්කාර, අරුග්ගොඩ, පානදුරය | ඒ. එච්. නැන්සිනෝනා, අරුක්ගොඩ, අලුබොමුල්ල |
| 18624 | ඇට්. ඒ. ඩබ්ලිව්. ජේ. ලිවේරා, නඹිරාවිල, වයික්කාල | එච්. ඒ. ඩී. ඇග්නස්හාමි, නඹිරාවිල, වයික්කාල |
| 18625 | ඒ. ඩී. ඇස්. අමරසේකර, බැන්ඩියවත්ත, වැල්ලම්පිටිය | පී. ඇම්. කෝස්තා, 319, බැන්ඩියවත්ත, වැල්ලම්පිටිය |
| 18654 | ඇස්. අල්ගවන්ත, 961, පන්නිපිටිය පාර, බත්තරමුල්ල, තලංගම | ටී. ඒ. ප්‍රේමලාල් එදිරිසිංහ, 122, වෝඩ් පෙදෙස, කොළඹ 7 |
| 18708 | ර්. ඇට්. ජී. ඩබ්ලිව්. ඇල්. ඒකනායක, යටවර, වත්තේගම | ඩී. ඇම්. ඩී. ජී. පොඩිමැණිකෙ, යටවර, වත්තේගම |
| 18734 | ඒ. රෝ. පාතුමා සහ ඒ. කේ. යු. ලමීරා, 23/8, කටුගොඩ පරණවත්ත, ගාල්ල | රෝ. ගුණවර්ධන, එලියට් පාර, ගාල්ල |
| 18735 | එච්. ඇම්. ඒ. කාදර්, 300, ත්‍රිකුණාමල වීදිය, මාතලේ | ඒ. ජේ. ඒ. අයිස්, හිටපු ටවුන් ආරච්චි, ගොඩපොල පාර, මාතලේ. |
| 18736 | කේ. ආර්. පෙරේරා, සහ ඩබ්ලිව්. ඊ. පී. ඇම්. ප්‍රනාන්දු, බැන්ඩියමුල්ල, ගම්පහ | ඇම්. ඒ. ඩී. එජ්. ජයවර්ධන, පල්ලිය පාර, බැන්ඩියමුල්ල, ගම්පහ |
| 18750 | ටී. කන්දසාමි, කනගරායන්කුලම්, මාන්කුලම් | ඇස්. කනපතුපිල්ලේ, කනගරායන්කුලම්, මාන්කුලම් |
| 18756 | ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. විරසිංහ, ආර්. ඒ. ඩී. ඩබ්ලිව්. කරුණාරත්න, ආර්. ඒ. ඩී. ඩෝරා, ආර්. ඊ. ඩී. දයානන්ද, ආර්. ඒ. ඩී. පියසිලි, 954, ඇතුල්කෝට්ටෙ, කෝට්ටෙ | 1. ඇල්. ඇෆ්. බැස්ටියන්ස්, 19, පෝපිල්ඩ් රෝඩ්, කොටහේන 2. ටී. ඇම්. ඒ. බැස්ටියන්ස්, 19, පෝපිල්ඩ් රෝඩ්, කොටහේන |
| 18760 | වයි. බී. නන්දාපාලව්, 30, හේලිපාර, ඇහිලිගොඩ, ගාල්ල | ඇල්බට් ගුනසේකර, ඇහිලිගොඩ, ගාල්ල |
| 18775 | ඩබ්ලිව්. ඒ. පීරිස්, 25/2, සුබෝධාරාම පාර, දෙහිවල | ටී. සවුන්දනායගම්, 41/1, ශ්‍රී සරනන්කර පාර, දෙහිවල |
| 18799 | ඇම්. ඒ. ඇජ්. වණිගරත්නම්, 61, ඇත්ගාල, කොට්ටිකාවේ | 1. එච්. ඩී. ඇම්. වයලට්හාමි, කදවල, කටාන 2. එච්. ඩී. පාවුලු අප්පුහාමි, කදවල, කටාන |
| 18821 | ඇන්. ඒ. මල්හාමි, ගොලුගම්මන, හරන්කහව | ඇස්. පී. නන්දුවා නොහොත් නන්දෝරිස්, කඳන්හේන හරන්කහව |
| 18848 | ඩබ්. ඒ. ඩබ්. පෙරේරා, ඇම්. ඩබ්. පෙරේරා, දුටුගැමුණුපාර, පාමංකඩ, දෙහිවල | පී. එච්. ටී. පෙරේරා, 45, ශ්‍රීමහාවිහාර පාර, කළුබෝවිල, දෙහිවල |
| 18882 | ඇම්. එච්. ජයනෝරිස්, කැකුලන්දල, අගලවත්ත | පී. කේ. ඩී. රොසලින් නෝනා හාමිනේ, දපිලිගොඩ, අගලවත්ත |
| 18867 | එච්. හමීඩ්ගේ දූ අන්සා උම්මා, බියපහල, මාතලේ නගරය, මාතලේ | 1. ජේ. ටී. සිරිවර්ධන, ඊ. ඇල්. සමරසේකර පෙරකදෝරු මහතා බාරේ, මාතලේ. 2. ජේ. ඒ. සිරිවර්ධන, පරපේ වලව්ව, මිරියගොඩ, ගාල්ල |
| 15938 | එච්. ටී. පියසේන, 97, උඩුමුල්ල, මුල්ලේරියාව, අංගොඩ | ඇම්. ඩී. ඇසන් අප්පුහාමි, (තලගහවත්ත) උඩුමුල්ල, මුල්ලේරියාව, අංගොඩ |
| 16090 | ඒ. බී. එන්සොහාමි, කිරාණගම, හික්කඩුව | කේ. ඩබ්. ධර්මදාස, කලමුල්ල, කටුකුරුන්ද, කළුතර |
| 16389 | ඒ. එච්. ඇම්. රශීඩ් සහ එම්. ඒ. කේ. ඒ. කපූර්, 522, නිරල්ල, අකුරණ | 1. පී. අයි. ලෙබ්බෙගෙ පුත් අබුබකර්, අකුරණ<br>2. ඊ. ලෙබ්බෙගේ පුත් ඇම්. රෂීඩ්, අකුරණ<br>3. ජී. ඒ. කාදර්ගේ පුත් පයිනුලබ්දීන, අකුරණ<br>4. එස්. එම්. ටී. ගොන්සාල්, ''කැස්ටල් හිල්'', වීදිය, නුවර<br>5. ඕ. චෙට්ටියාර් සහ පුත්‍රයෝ, මහවීදිය, මාතලේ |
| 17052 | ඇම්. ඩී. කේ. පීරිස්, 1 වෙනි හරස් වීදිය, මාරාවිල | ඩබ්. ඇම්. ප්‍රනාන්දු, ගංගොඩ, මාරාවිල |
| 17072 | පී. ඩබ්. ඒ. සච්නෝරිස් අප්පු, මහලදූව, බලපිටිය | ඒ. ජී. කේ. ද සිල්වා හෙවත් ඇසිලින් නොහොත් කේ. වංශවතී, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 17172 | ඇස්. ඇම්. මුදලියාරි, කනගසබෙයි පාර, මානිප්පේ | ඇල්. පී. ආර්. තම්බිරාජාගේ භාර්යාව සහ ටී. වාමදේවන් (සැවොම) මානිප්පේ දකුණ, මානිප්පේ |
| 17181 | ඇස්. ටී. රොසලිනාහාමි සහ පී. සොමිපාල, 20/1, පොත්ගුල් විහාර මාවත, රත්නපුර | කේ. ඩී. පෙරේරා, ගැටන්ගම, රත්නපුර |
| 17409 | 1. එච්. චාර්ලිස්, 2. ජී. ඩී. දෝසිනෝනා, 3. එම්. ජිනපාල, 4. පී. ඩී. සෝමපාල, කුඩා උඩුව, හොරණ | ජී. ඩී. රොබෝසිංඤෝ, දකුණු උඩුව, හොරණ |
| 17444 | ඩබ්. පී. ටී. හෙඩ්විජ්ස් ප්‍රනාන්දු, මාරාවිල | ඩබ්. ඇස්. දබරේරා, මාරවිල (මියගොස්), ඩබ්. ඇම්. ප්‍රනාන්දු ''ජසින්තා'', මාරවිල |
| 17466 | ජේ. ඇම්. සයිමන් සිංඤෝ, පන්නල | ආර්. ඒ. විරසේකර අප්පුහාමි, දන්ගොල්ල, පන්නල |
| 17548 | ජී. ඇස්. සිල්වා, කලමුල්ල, කළුතර | ජී. ට්. සිල්වා, කලමුල්ල, කළුතර |
| 17481 | ඩබ්. ඒ. සෙනෙවිරත්න, කිණදෙනිය, අඹේපුස්ස | ඒ. අප්පුහාමි, කැබැල්ලවිට, අඹේපුස්ස |
| 18916 | ඒ. කේ. පී. සනි, ''විජේ නිවස'', මැදකැටිය, තංගල්ල | කො. ම. ශ්‍රීණිදාස, සාමාන්‍ය වෙළඳ තැන, තෙල් ගබඩාව, තිස්සමහාරාමය |
| 18924 | වැ. ආ. ඇසිලින් සිල්වා, කලමුල්ල, කළුතර | ජී. පාවුළු සිල්වා, ''විජයසිරි නිවස'', කලමුල්ල, කළුතර |
| 16782 | 1. ඩබ්ලිව්. බෙන්ජමින් පෙරේරා, 2. ඒ. මාර්තා මරියා ප්‍රනාන්දු, දුම්රියපල පාර, කටුනායක | ටී. ජොසපින් කොස්තා, ශාන්ත සෙබස්තියන් මාවත, කටුනායක |
| 16923 | එල්. ටී. එම්. එස්. සාවුල් හමීදු, හිටපු ගම්මුලාදැනි තැන, සවරාන, හලාවත | එම්. එල්. ඊ. පැට්‍රෝනියස් ප්‍රනාන්දු, ශාන්ත මරියා පාර, හලාවත |
| 18155 | කේ. සින්තම්පරම්, කොට්ටියා වත්තෙයි, දකුණු පුලොලි, පොයින්ට් පේද්‍රු | කදිරන් වේලන්, කොට්ටියා වත්තෙයි, දකුණු පුලොලි, පොයින්ට් පේද්‍රු<br>පවරන ලද අය :—වල්ලිමුරුගන් නොහොත් සෙල්ලන්, දකුණු පුලොලි, පොයින්ට් පේද්‍රු |

11–424

## 1966 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම වවුනියා දිස්ත්‍රික්කය

1965 දෙසැම්බර් මස 1 වැනි දින සිට වවුනියා දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර ඒ ඒ කොට්ඨාශ භාර ප්‍රාදේශිය ආදයම් නිලධාරීන් විසින් අළුත් කරනු ලබන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙසින් දන්වමි. බලපත්‍ර අළුත් කිරීම සඳහා සෑම අයදුම් පතක්ම 1965 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර ඒ ඒ ප්‍රා. ආ. නි. ට යැවිය යුතුය. 1965 බලපත්‍ර සහ තුවක්කු, පරීක්ෂා කිරීම සඳහා මවිසින් බලය පවරා ඇති නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. 1965 දෙසැම්බර් 31 වැනිදසින් පසු බලපත්‍ර අළුත් කිරීම සඳහා එවන අයදුම්පත්, භාර ගතහොත් බලපත්‍ර ගාස්තුවට සමාන දඩයකට යටත් කරනු ලැබේ. මෙම දඩය අයකරගෙන 1966 මාර්තු 31 වැනිදා දක්වා ප්‍රා. ආ. නි. විසින් බලපත්‍ර අළුත් කරනු ලැබේ.

2. 1966 මාර්තු 31 වැනිදා වනවිට අළුත් නොකරනු ලබන බලපත්‍ර සඳහා නවු පවරනු ලැබේ.

ඩී. ඇම්. පී. බී. දසනායක,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1965 නොවැම්බර් 1 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේදිය.

11-324

---

## මාතර දිස්ත්‍රික්කයේ 1966 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

මාතර දිස්ත්‍රික්කයේ 1966 වර්ෂයට තුවක්කු තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ බලපත්‍ර අළුත් කිරීම හා අළුතෙන් බලපත්‍ර නිකුත් කිරීම ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශිය ආදායම් නිලධාරීන් විසින් 1965 දෙසැම්බර් මස 1 වෙනිදා සිට 1966 යේ මාර්තු මස 31 වෙනිදා දක්වා කරණු ලබන බවද ඒ සම්බන්ධ ඉල්ලුම් පත්‍ර කොට්ඨාශයේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි වෙත යැවිය යුතු බවද මහජනයා වෙත මෙසින් දැනුම් දෙමි.

මෙම කාලය තුල බලපත්‍ර අළුත් කිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරණ ඉල්ලුම් පත්‍ර මාතර කච්චේරියේ දී භාරගනු නොලැබේ.

බලපත්‍ර අළුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රවල සඳහන් සෑම තුවක්කුවක්ම එම බලපත්‍ර අළුත් කිරීමට මවිසින් බලය දෙන ලද නිලධාරි තැන වෙත බලපත්‍රය අළුත් කිරීමට පෙර පරීක්ෂණය පිණිස ඉදිරිපත් කළ යුතු බවද මහජනයා වෙත මෙසින් දැනුම් දෙමි.

තුවක්කු තබාගැනීම හා පාවිච්චි කිරීම සඳහා දෙන ලද සෑම බලපත්‍රයක්ම 1965 අවසානයේදී අවලංගු වන බවද 1966 වර්ෂය සඳහා බලපත්‍ර 1965 දෙසැම්බර් මස 31 වෙනිදාට පෙර නියමිත ප්‍රාදේශිය ආදායම් කාර්යාලයේදී අළුත් කළ යුතු බැව් වැඩිදුරටත් මහජනයා වෙත මෙසින් දැනුම් දෙමි. 1966 ජනවාරි මස 1 වෙනිදා සිට 1966 මාර්තු 31 වෙනි දා දක්වා බලපත්‍ර අළුත් කිරීමට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරණ විට බලපත්‍ර ගාස්තුව හා සමාන දඩ මුදලක් ගෙවිය යුතු බවත් මෙසින් දැනුම් දෙමි.

1966 මාර්තු 31 වෙනිදා තෙක් අළුත් නොකරණු ලැබූ සෑම බලපත්‍රයක්ම සඳහා නවු පවරන බවද, මහජනයා වෙත වැඩිදුරටත් දැනුම් දෙමි.

එෆ්. සී. පීටර්ස්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත
සහ බලපත්‍ර අධිකාරී.

දිසාපති කාර්යාලය,
මාතර,
1965. 10. 30.

11-374

---

## නිවේදනයයි

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සිංහල පත්තු ප්‍රාදේශිය ආදායම් නිලධාරීගේ කාර්යාලය, මින්නේරියේ ගම්සභා කාර්යාල ගොඩනැගිල්ලේ සිට හිඟුරක්ගොඩ (ආර්.බී. 3 ඇළ අසල) "පරණ ගම් වගා කිරීමේ නිලධාරීගේ නිවාසයට" 65.10.1 වැනි දින ගෙන යන ලද බැව් මහජනයාගේ දනගැනීම පිණිස මෙසින් නිවේදනය කරනු ලැබේ.

පු. බ. දිසානායක,
පොලොන්නරුවේ දිසාපති වෙනුවට.

1965 නොවැම්බර් මස 3 වැනි දින,
පොලොන්නරුවේ දිසාපති කාර්යාලයේ දිය.
11-427

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත් වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ සැ. 243 ද. 47 හි නෑදන්කුලම පාර වැටී ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත් වැඩියා කරනු ලබන හෙයින් 1965.11.24 වෙනි බදාද පස්වරු 6.00 සිට 8.00 දක්වා අර්ධ වශයෙන්ද, 1965.11.24 වෙනි බදාද පස්වරු 8.00 සිට 65.11.25 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12.00 දක්වා සම්පූර්ණ වශයෙන්ද රථ වාහන ගමනාගමනයට වසා තබනු ලැබේ. මේ කාලය තුලදී රථවාහන ගමනාගමනයට සැ. 243, ද. 68, පු. 43 හි උප්පකුලම් වීති දුම්රිය හරස් පාරේන් ඉඩ සලසනු ලැබේ.

ඇන්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

11-312

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත් වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ සැ. 157, ද. 79, පු. 75 හි, වවුනියාව හා පූලියම්කුලම් දුම්රිය ස්ථාන අතර, මන්නාරම් පාර වැටී ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත් වැඩියා කරනු ලබන හෙයින් 1965.11.21 වෙනි ඉරිදා පෙරවරු 2.00 සිට 10.30 දක්වා සම්පූර්ණ වශයෙන් රථ වාහන ගමනා ගමනයට වසා තබනු ලැබේ. මේ කාලය තුලදී රථ වාහන ගමනා ගමනය වවුනියා-වයිරවාපූලියම්කුලම් පාරෙන් (දුම්රිය ස්ථාන පාරෙන්) හරවා යවනු ලැබේ.

ඇන්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

11-314

---

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.